**මීගමුව මහා නගර සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

මීගමුව මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

1.2.2(අ), 1.2.1(ආ), 1.2.1(ඇ), 1.2.1(එ),1.2.2(අ), 1.2.2(ඇ), 1.2.3, 1.2.5(ආ), (ඇ), 1.2.6(ආ)(i), 2.3.3, 3.1(අ), 3.5 හා 3.6

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 18.7 ප්‍රකාරව සභාව සතු වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 22 දිනැති හා LGD/10A/4/න.ගි./2019 අංක දරන ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි වෙනම හඳුනාගෙන නොතිබූ අතර, පරිගණක හා පරිගණක මෘදුකාංග යන්ත්‍ර ගිණුමෙන් වෙන්කර හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් හඳුනා ගැනීමේ නාගරික ඉංජිනේරුගේ වාර්තාව ලැබීමෙන් පසු ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු අතර ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ජර්නල් සටහනක් මඟින් සටහන් අංක 05 යටතේ අයහාරයක් ලෙස දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ලැබූ ලෙස ගිණුම් ප්‍රතිපත්ති යටතේ අනාවරණය කර තිබූ රු.73,772,323ක් වූ ප්‍රාග්ධන ආධාර මුදල් එසේ ගිණුම්ගත කොට නොතිබුණි. | සටහන් අංක 10 යටතේ සටහන් නොකොට ලද ආදායම් හා වියදම් ගිණුමට ගැලපීම් කර ඇති බව දන්වමි. | |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීපුර ඉඩමේ සම්පත් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ජපානයේ Global Environmental Strategies ආයතනය විසින් අදියර 3 කින් එවිය යුතු ප්‍රතිපාදනවලින් එක් අදියරයක ප්‍රතිපාදන වූ රු.3,679,900 ක් 2020 නොවැම්බර් 02 දින ලැබී තිබූ නමුත් එය සමාලෝචිත වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන යටතේ ගිණුම්ගත නොකොට මිශ්‍ර තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීම නිසා තැන්පත් ගිණුමට සටහන් කර ඇති බව දන්වමි. | |
| (ආ) | පුස්තකාල ව්‍යාපෘතියේ වන්දි ගෙවීමක් සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී තිබූ මුදලකින්, 2020 සැප්තැම්බර් 07 දින ලැබී තිබූ රු.6,000,000 ක ඉතිරි මුදල, අයභාරය ලෙස ගිණුම්ගත නොකොට මිශ්‍ර තැන්පත් ලෙස ගිණුම් ගතකර තිබුණි. | 2021 වර්ෂයේ ආදායමට ගෙන ඇති බව දන්වමි. | |
| (ඇ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 9 මගින් රු.23,311,429 ක් මුල්‍ය පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණද රු.19,477,308 ක් වූ ණය වාරිකද ඒ තුළ ඇතුලත් වීමෙන් එම වටිනාකමින් වියදම් වැඩියෙන් හා අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | සටහන් අංක 09 සටහන් තැබීමේ සිදුවූ වරදක් බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | ණයහිමියන්ට වැඩිපුර ගෙවූ රු.6,764,007 ක් ණයගැතියන් ලෙස ගිණුම් ගත නොකොට මුළු විවිධ ණයහිමි ශේෂයෙන් අඩුකර දැක්වීමෙන් එම වටිනාකමින් ණයහිමි ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | නිරවුල් කළ පසු තොරතුරු විගණනයට වාර්තා කරන බව දන්වමි. | |
| (ඉ) | හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ ලෙස රු.273,536,362 ක් වත්කම් වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණේ ගෙවිය යුතු ලෙස සඳහන් ගිණුම් 03 ක ශේෂ එකතුව වූ රු. 283,450 ක් අඩු කිරීමෙන් පසුව වූයෙන් එම වටිනාකමින් ලැබිය යුතු ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | 2021 ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයභාරයේ සටහන් අංක 04 පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු.356,439,296 ක් ලෙස දක්වා තිබුණද එය තුළ බාහිර ප්‍රාග්ධන ප්‍රදාන රු. 36,881,243 ක් ඇතුලත් වූයෙන් එම වටිනාකමින් අයභාරය වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | සේවක ඇප තැන්පතු 02 ක වටිනාකම වූ රු.60,000 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණද එය සේවක ඇප ආයෝජනවලින් ඉවත් කර නොතිබීමෙන් එම වටිනාකමින් ඇප ආයෝජන වැඩියෙන් දක්වා තිබුණි. | 2021 ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. | |
| (ඌ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පරිහරණය කරන කාර්යාලය සඳහා 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ කුලිය වූ රු. 909,000 ක් ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි නිසා ගිණුම්ගත කර නොමැති බව දන්වමි. | |
| (එ) | සමාලෝචිත වර්ෂයට ප්‍රතිපාදන අනුමතව 2021 වර්ෂයේ ලැබී තිබූ සපිරිගමක් ජනතා සහභාගිත්ව හා ග්‍රාමීය යටිතල සංවර්ධන වැඩ සටහන් 29 ක රු.23,910,885 ක ප්‍රතිපාදන මුදල්, ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඒ) | සපිරිගමක් ජනතා සහභාගිත්ව හා ග්‍රාමීය යටිතල සංවර්ධන වැඩ සටහන් 26 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගතවී සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර 2021 වර්ෂයේ ගෙවීම් කර තිබූ රු.25,154,401 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 15 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා අනුරූපි වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.183,390,158 ක ශේෂ වෙනස්කම් විය. | 2021 වර්ෂයේ ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.431,348,282 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාල විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/සත්‍යතාක්ෂණය කිරීමට නොහැකි විය. | 2021 වර්ෂයේ ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සඳහා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 12,330,794 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.181,543,820 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.170,628,000 ක හිඟ වරිපනම් ශේෂයක් විය. | කොරෝනා වසංගතය පැවතීම හේතුවෙන් මෙම හිඟය ඇතිවීමට හේතුවී ඇති බව දන්වමි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුවේ. |

**2.2.2 කුලී**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සාප්පු සංකීර්ණයේ කඩ කාමර 12 කින් රු. 2,082,026 ක් හා නව බස් නැවතුම්පල සාප්පු සංකීර්ණයේ කඩ කාමර 06 කින් රු. 5,568,772 ක්ද වශයෙන් එකතුව රු. 7,650,798 ක් 2020 දෙසැම්බර් 31 දිනට ටෙන්ඩර් හා කුලී හිඟ වශයෙන් අයවීමට තිබුණද එම කඩ කාමර මුද්‍රා තැබීමට කටයුතු කිරීම හැරුණු විට එම මුදල් අය කර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට පියවර ගනිමින් පවතින බව දන්වමි. | හිඟ මුදල් අය කිරීමට පියවර ගත යුතුවේ. |

### 2.2.3. බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1990 වර්ෂයේ සිට පැවත එන කොච්චිකඩේ උප කාර්යාලයේ රු.2,600,725 ක බලපත්‍ර ගාස්තු හිඟයන් සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා තීරණය පරිදි කටයුතු කිරීමට තීරණය කර ඇති බව දන්වමි. | හිඟය අය කිරීමට පියවර ගත යුතුවේ. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු පිරිවැය රු.15,000,000 ක් යටතේ සභාවේ කාර්යාල කටයුතු පරිගණකගත කිරීමේ II අදියර සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර 2020 පෙබරවාරි 14 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුගමනය කර තිබූ ක්‍රමවේදය, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) වගන්තියේ සඳහන් අරමුණුවලට පටහැනි බැවින් නැවත මිල ගණන් කැඳවීමේ ලේඛන පිළියෙල කිරීමට හා මිල ගණන් කැඳවීමට නිර්දේශකර තිබූ හෙයින්, ඒ වන විටත් පළමු මිල කැඳවීම සඳහා 2019 නොවැම්බර් 06 දින වැයකර තිබූ රු.198,645 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | ලේඛනවල ඇතිවූ අඩුපාඩු හේතුවෙන් නැවත මිල ගණන් කැඳවීමට තීරණය කර ඇති බව දන්වමි. | වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අය කිරීමට පියවර ගත යුතුවේ. |

### 3.2 අපේක්ෂිත කාර්යය ඉටු නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "මීගමුව නගරය, අංකිත පුරවරයක් බවට පත්කිරීම" ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කාර්යය ඉටු නොවීම හා ව්‍යාපෘතිය සඳහා වැය ශීර්ෂ ඉක්මවා වියදම් දැරීම හේතුවෙන් ගම්පහ පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ව්‍යාපෘතිය නැවත නිර්දේශ කිරිම අත්හිටුවා තිබියදී, 2019 ඔක්තෝබර් 10 සිට 2021 අප්‍රේල් 18 දින දක්වා අවස්ථා 03 කදී ව්‍යාපෘති කාලය මාස 06 බැගින් දීර්ඝ කිරීමට සභා අනුමැතීන් ලබා දී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විටත්, ග්‍රාම සේවා වසම් 39 | මේ වන විට ග්‍රාම නිලධාරි වසම් 11 ක මාර්ග හා කාණු සිතියම්ගත කිරීම අවසන් කර ඇති බව දන්වමි. | ව්‍යාපෘති වාර්තාව අනුව කාර්යසාධනයට ලඟා විය යුතුවේ. |

කින්, වසම් 11 ක පමණක් අංකිත සිතියම් නිර්මාණය කර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා සේවකයන් 7-20 අතර සංඛ්‍යාවකට වැටුප් වශයෙන් 2019 වර්ෂයේ රු.1,922,172 ක් හා 2020 වර්ෂයේ රු 1,615,152 ක් ද සේවක අර්ථසාධක අරමුදල සඳහා සභාවේ දායකත්වය ලෙස 2019 හා 2020 වර්ෂය සඳහා පිළිවෙලින් රු.250,718 ක් හා රු.213,031ක් වශයෙන් වියදම් දරා තිබූ අතර මේ සඳහා අය වැය මඟින් වෙන් කර තිබූ මුදල පිළිවෙලින් රු.890,000 ක් හා රු.700,000 ක් විය. මෙම කරුණු සැලකීමේදී දැරූ වියදම්වලට සාපේක්ෂව ව්‍යාපෘතියෙහි කාර්යසාධනය ප්‍රමාණවත් මට්ටමක නොපැවතිණි.

## 3.3 අරමුණු ඉටු නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රමවත් පහන් කණු ගණනය කර නගරය ආලෝකමත් කිරීමේ ව්‍යාපෘතිය 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2018 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාව තුළ අවසන් කිරීමට ඇස්තමේන්තු කර පළාත් සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලැබී නොතිබියදී අනුමැතියකින් තොරව සේවකයින් 12 දෙනෙකු සඳහා රු.711,990 ක් ගෙවීම් කර තිබුණි. ව්‍යාපෘති වාර්තාවට අනුව ඇස්තමේන්තුගත කණු සංඛාව 18300 ක් වූ අතර එම වාර්තාවට අනුව මුල් 6 මාසය තුල කණු අංක කිරිම, අවසන් කිරිම සිදු කල හැකිව තිබුණි.ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මෙහෙයවීම් කටයුතු නිසි අයුරින් අධීක්ෂණය නොවීම නිසා මෙය අවසන් කර නොතිබූ අතර 2020 පෙබරවාරි 15 දින වන විට කණු අංක කර තිබුණේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 39 කින් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 8 ක කණු 7271 ක් පමණි. මෙම ව්‍යාපාතියෙන් බලාපොරොත්තුව තිබූ අරමුණු ." මීගමුව නගරය අංකිත පුරවරයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය" යටතේද ඇතුලත්ව ඇති බැවින් ව්‍යාපෘති 2 ක අවශ්‍යතාවයක් නොවන බව පළාත් සහකාර කොමසාරිස්ගේ විසින්ද තහවුරු කර තිබුණි. | නව කාර්යයක් බැවින් අත්දැකීම් ලබා ගනිමින් කාර්යය සිදු කළ නිසා මුල් මාස 06 තුළ අංකනය කිරීමට හැකි වූයේ උඩයාර්තොප්පුව ග්‍රාම නිලධාරි වසම පමණක් බව දන්වමි. | ව්‍යාපෘති වාර්තාව අනුව කාරයසාධනයට ලසා විය යුතුවේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජපානයේ Global Environmental Strategies ආයතනය විසින් අදියර 3 කින් සමන්විත ඇමරිකන් ඩොලර් 43,300 ක අධාරයක් යටතේ මීපුර ඉඩමේ සම්පත් | නගරවාසීන්ගේ උද්ඝෝෂණ හේතුවෙන් ස්ථානය වෙනස් කිරීමට සිදුවූ ඇති බව දන්වමි. | ආධාර ලබා දෙන ආයතනවලට නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් මස 21 දින රු.9,901,223 කට ගිවිසුම්ගතවී තිබූ අතර එහි මූලික වැඩ ආරම්භ කර තිබියදී නගරවාසීන්ගේ උද්ඝෝෂණ හේතුවෙන් 2021 පෙබරවාරි 05 දින එම ඉදි කිරීම එම ස්ථානයේ කළ නොහැකි බව වාර්තා කර තිබුණි. එම නිසා එම ඉදිකිරීම කොච්චිකඩේ පැරණි සෝතකාගාරයක පිහිටි ඉඩමක් තෝරාගෙන ඉහත කොන්ත්‍රාත්කරුට පවරා තිබූ අතර නැවත ගිවිසුම්ගතවී නොතිබුණි. අදියර 3 කින් ලැබිය යුතු ආධාර මුදලින් රු.3,679,900 ක් 2020 නොවැම්බර් 02 දින ලැබී තිබූ අතර භූමිය වෙනස් කළ බව දැනුම් දීමක් සිදු නොකොට අත්තිවාරම් වැඩ සම්පූර්ණ කර , ඉතිරි වැඩ මුල් ඉඩමේ කරමින් පවතින බව සඳහන් කර දෙවන අදියරේ ප්‍රතිපාදනය වූ රු. 2,633,300 ක් 2021 මාර්තු 31 දින ලබාගෙන තිබුණි. | | |
| (ආ) | සභාවට අයත් පොල, කඩ ආදි දේපල 2020 වර්ෂය සඳහා බදු දීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව කටයුතු කිරීම නිසා තරඟකාරි තත්ත්වයක් මගින් වැඩි මිලක් ලබාගැනීමේ තිබූ අවස්ථාව සභාව විසින් අහිමිකරගෙන තිබුණි. සභාවේ වත්කම් 6 ක්ම 2018 හා 2019 වර්ෂවල මිලටම ලබාදීම නිසා 2019 වර්ෂයේ මිලට සියයට 10 ක් වැඩිකර හෝ ලබා නොදීම හේතුවෙන් සභාවට සිදුව තිබූ පාඩුව රු.3,119,781 ක් විය.මහා නගර සභා ආඥා පනතේ 228 හා 229 වන වගන්තිවලට පටහැනිව පෙර වර්ෂයේ බදු මුදලට යම් ප්‍රතිශතයක් වැඩිකර පෙර වර්ෂයේ බදුකරුට නිත්‍යානුකූල නොවන අයුරින් ලබාදෙන බව අනාවරණයවී ඇති හෙයින් නෛතික ප්‍රතිපාදන මත දේපළ බදුදී එය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජූලි 20 දිනැති අංක LGD/06/05/M05/2019 දරන ලිපියෙන් තවදුරටත් දන්වා තිබුණි. | සභා තීරණය පරිදි ලබාදී ඇති බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | නව බස් නැවතුම්පල සාප්පු සංකීර්ණයේ 2 වන මහලේ විවෘත ශාලාව පෞද්ගලික ආයතනයක් විසින් 2018 දෙසැම්බර් 10 දිනැතිව කරන ලද ඉල්ලීමක් මත 2019 පෙබරවාරි 27 දින සිට වසර 25 ක | සිනමා ශාලාව ආරම්භ කිරීමට පියවර ගෙන අදාල ආදායම් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | රජයේ තක්සේරුවට අනුව බදුදී සහා ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | කාලයකට බදුදී තිබු අතර ඒ සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2007 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීමකදී දක්වා තිබු රු.8,988,060 ක අවම මිලට 2019 පෙබරවාරි 07 දින සභා තීරණය පරිදි රජයේ තක්සේරුවක් නොමැතිව ලබා දීමෙන් සභාවට පාඩුවක් සිදුකර තිබුණි.ශාලාවේ අලුත්වැඩියාන් සිදු නොකිරීම නිසා යෝජිත සිනමා ශාලාවේ වැඩ ආරම්භ කිරීමට නොහැකිවී තිබු අතර 2021 පෙබරවාරි 15 දින වන විටත් සභාවට ලබා ගැනීමට තිබු ආදායම් අහිමි කර තිබුණි. | | |
| (ඇ) | තැබෑරුම්වත්ත ඉඩම 2014 වර්ෂයේ සිට රෙදි පිළි විකිණීමේ ආයතනයේ රථ ගාලක් සඳහා 2017 ඔක්තෝබර් 23 දින සිදුකර තිබු තක්සේරුවට අනුව වර්ෂ 02 ක් සඳහා බදුදී තිබූ අතර අයකර ගත යුතු මාසික කුලිය රු.220,000 ක් ලෙස දක්වා තිබුණි. 2017 නොවැම්බර් 25 දින සිට මාසික කුලිය රු.150,000 ක් ලෙස වැඩිකර තිබු අතර වර්ෂ 2 කට පමණක් බල පැවැත්වෙන තක්සේරුවක් වන හෙයින් 2019 සිට ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර නැවත තක්සේරුවක් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. මෙම ආයතනය විසින් එම රථගාල පාවිච්චි නොකරන කාලය සඳහා සභාවේ සේවකයෙකු යොදවා ආදායම් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව සභාව විසින් සොයා බලා නොතිබුණි. | සංවර්ධන කටයුතු අරඹන තෙක් තාවකාලික පදනම මත ලබාදී ඇති බව දන්වමි. | රජයේ තක්සේරුවට අනුව කටයුතු කර සභා ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | ඒත්තුකාල වෙරළ උද්‍යානයේ රථගාලේ ගාස්තු අයකිරීම සම්බන්ධ බදුකරය 2003 වර්ෂයේ සිට 2006 දක්වා ටෙන්ඩර් කැඳවීමෙන්ද එතැන් සිට 2019 වර්ෂය දක්වා පෙර බදු මුදලට සියයට 10-20 දක්වා වූ ප්‍රතිශතයන් වැඩිකර ආරම්භයේ සිට මේ දක්වා එක් අයෙකුට ලබාදී තිබුණි. 2019 වර්ෂයේ බදු මුදල රු.2,244,000 ක් වූ අතර 2020 වසර සඳහා පසුගිය වසරේ බදු මුදලට, පෙර බදුකරුටම ලබාදීමට 2019 ඔක්තෝබර් 05 දින සභාව තීරණය කර තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජුලි 24 දිනැති LGD/06/05/MOS/2019 අංක දරන ලිපිය පරිදි සභා දේපල බදුදීමේ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීමට පියවර ගන්නා ලෙසට උපදෙස් ලබාදී තිබුණද මේ සඳහා මහා නගර සභා ආඥා පනතේ 229 | සභා තීරණය පරිදි ලබාදී ඇති බව දන්වමි. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ. |

වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණි. (සභා තීරණ ලැබීමට පෙර මෙම රථගාල රුපියල් ලක්ෂ 30 කට බදු ගැනීමට කැමති බවට ඉල්ලීමක් කර තිබූ අතර එම මුදලට වඩා රු.756,000 ක අඩු මුදලකට ලබාදීම නිසා එම වටිනාකමින් සභාවට පාඩුවක් සිදුව තිබුණි.)

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 භාණ්ඩ හා සේවා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය සඳහා නාගරික මන්ත්‍රීවරුන් මගින් පාසැල් දරුවන් හට බෙදා දීමට අවශ්‍ය අභ්‍යාස පොත් මිලදී ගැනීම සඳහා 2019 වර්ෂයේ රු.17,954,896 ක් ද 2020 වර්ෂයේ රු.360,249 ක්ද දරා තිබුණද ඇස්තමේන්තු කර තිබූ මුදල රු.7,616,901 ක් වූයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 වගන්තියට පටහැනිව තරගකාරී ලංසු ක්‍රමයයෙන් බැහැරව සැපයුම්කරුවෙකු තෝරා ගෙන තිබූ අතර එමගින් සභාවට ලබා ගැනීමට තිබූ වාසි අහිමිකරගෙන තිබුණි.ඇණවුම් කර දින 14 ක් ඇතුලත එනම් 2020 ජනවාරි 17 දින වන විට ඇණවුම් කර තිබූ පොත් විටින් විට ලැබී තිබූ අතර වර්ග 14 ක පොත් 12950 ක් 2021ජනවාරි අවසානය වන විටත් ලැබී නොතිබුණි. තවද නාගරික මන්ත්‍රීවරුන් 05 දෙනෙකු විසින් බෙදාහැරීමේ ලේඛන 2021ජනවාරි වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන භාර නොදුන් නාගරික මන්ත්‍රීන් හට ලිපි යොමු කරමින් පවතින බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ |
| (ආ) | කොච්චිකඩේ කසළ අංගනය වෙත 2020 වර්ෂයට වෙනුවෙන් බොරළු සැපයීම සඳහා රු.2,623,600 ක් ගෙවීම් කර තිබුණි.බොරළු සැපයිම සඳහා 2020 වර්ෂය වෙනුවෙන් බලපත්‍රලාභී සැපයුම් කරුවෙකු ලියාපදිංචි කර තිබුණද ඔහුගෙන් මිල ගණන් නොකැඳවා 2019 වර්ෂයේ බොරළු සැපයූ ආයතනය 2019 නොවැම්බර් 21 දින එවන ලද ඉල්ලීම මත 2020 වර්ෂය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තියේ විධි විධානවලින් බැහැරව එම ආයතනයෙන් 2020 ජූනි 17 හා 2020 අගෝස්තු 26 දින මිලදී ගෙන තිබුණි. මෙම ආයතනය 2020 වර්ෂයට බොරළු සැපයීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇති බවට සනාථ කරගෙන නොතිබුණි.මේ සඳහා ගිවිසුමේ කොන්දේසි අංක 3 ප්‍රකාරව සෑම මසකටම බොරළු කියුබ් 200 ක උපරිමයකට යටත්ව සැපයිය යුතු වුවත් 2019 දෙසැම්බර් 23 දින සිට 2020 මාර්තු 04 දින දක්වා පමණක් බොරළු සපයා තිබූ අතර එදින සිට 2021 | පෙර වර්ෂයේ මිලටම ගිවිසුම්ගතවීම නිසා වාර්ෂිකව සිදුවන මිල වැඩිවීම හා ප්‍රසම්පාදනයේ සිදුවන පිරිවැය ගත්කළ අලාභයක් සිදුවී නොමැති බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ |

| | | | |
|---|---|---|---|
| | පෙබරවාරි 10 දින වන විටත් බොරළු සැපයීම සිදුකර නොතිබුණි. මහජන පීඩාකාරී පනත යටතේ මීගමුව දිසා අධිකරණයේදී පවරා තිබූ නඩුවට 2017 ජුනි 05 දින දී ලබා දී තිබූ තීරණය ප්‍රකාරව කසළ වැසීම නිති පතා සිදුකළ යුතු වුවත් නඩු තීරණය සභාව විසින් නොසලකා තිබුණි.2020 පෙබරවාරි 14 දින කසළ කන්දට ගෙනැවිත් තිබූ බොරළු ප්‍රමිතියෙන් තොර ගල් මිශ්‍ර මකුළු පස් වූ අතර ගෙන එන ලද සියළුම පස් ප්‍රමිතියෙන් තොර වුවද පස් කියුබ් 5 කට පමණක් අඩුකර ගෙවීම් කර තිබුණි. බොරළු නොමැතිව තුනි කර ඇති කසළ විශාල ප්‍රමාණයක් පැවතීම නිසා ඒ තුලින් දුර්ගන්ධයක් වහනය වීමක් සිදුවන බැවින් මහජන විරෝධයක් ඇතිවීමේ හැකියාවක් මෙන්ම මදුරුවන් බෝවීමේ ප්‍රවනතාවයක් ඇති බවත් ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් 2019 දෙසැම්බර් 19 දින ලිඛිතව වාර්තා කර තිබුණි. | | |
| (ඇ) | කසළ තුනී කිරීම සඳහා D4E යන්ත්‍රයක සේවය ලබාගැනීම සඳහා 2020 ජනවාරි 01 දින සිට වර්ෂයක කාලයකට පෞද්ගලික ආයතනයක් සමඟ 2020 ජනවාරි 01 දින ගිවිසුම්ගතවී තිබූ අතර ඒ සඳහා රු.4,165,680 ක් 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසිකව ගෙවීම් කර තිබුණි. පසුගිය වර්ෂයේ ටෙන්ඩරය ලබා දුන් ටෙන්ඩර්කරුගේ 2019 නොවැම්බර් 21 ඉල්ලීම මත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව 2019 දෙසැම්බර් 05 දින සභා තීරණය මත එම ආයතනය වෙතම 2020 වර්ෂය සඳහාද ටෙන්ඩරය ලබාදී තිබුණි. | පෙර වර්ෂයේ මිලටම ගිවිසුම්ගතවීම නිසා වාර්ෂිකව සිදුවන මිල වැඩිවීම හා ප්‍රසම්පාදනයේ සිදුවන පිරිවැය ගත්කළ අලාභයක් සිදුවී නොමැති බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ |
| (ඈ) | මීගමුව බස්නැවතුම්පල හා අවට පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සේවා ආයතනයන් තෝරා ගැනීම පිණිස 2019 ඔක්තෝබර් 17 දින මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයන් මසකට රු.541,566 ක් ගෙවා සේවා සපයා ගැනීමට නිර්දේශ කර තිබුණි. 2019 දෙසැම්බර් 05 දින රැස්වූ මහා සභාව විසින් පසුගිය කාලය තුල සේවා සැපයූ 2 වන අඩුම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය සම්බන්ධයෙන් මේ වනතෙක් කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බැවින්ද, නාගරික බල ප්‍රදේශය තුල පවතින ආයතනයක් වන බැවින්ද හා වැඩි පලපුරුද්දක් මෙම ආයතනය සතුව ඇති බවද සලකා 2 වන ලංසුව ඉදිරිපත් කළ ආයතනය වෙතින් එම සේවාව සපයා ගැනීමට අනුමත කර තිබුණි.ඉහත දෙවන අඩුම මිලට ටෙන්ඩරය පැවරීම නිසා සභාවට වාර්ෂිකව රු.151,608 ක පාඩුවක් සිදුවන බව හඳුනා ගත හැකිව තිබුණි. | මිල ගණන් වෙනසට වඩා සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වා ඇති බව දන්වමි. | තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුවේ. |